# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2267/38 – 2022 පෙබරවාරි මස 17 වැනි බ්‍රහස්පතින්දා – 2022.02.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 57 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/12/2021/CEB/212.
ප්‍රා. ලේ. ගේ යොමු අංකය: කැල/7/ඉඅ/3/302.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ I වන ජේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ II වන ජේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2022 පෙබරවාරි මස 11 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

උපලේඛනය

I. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, කැලණිය.

II. **ඉඩමේ විස්තරය.–** බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 257A- හිඹුටුවැල්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හිඹුටුවැල්ගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක GA/KEL/2021/427 සහ 2021.12.21 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – දොඹගහකුඹුර, කොන්ගහකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0166**

උතුරට: ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව සහ වෙනත් අය හිමිකම් කියන දොඹගහකුඹුර සහ කොන්ගහකුඹුර සහ ප්‍රාදේශීය සභා මාර්ගය; නැගෙනහිරට: ප්‍රාදේශීය සභා මාර්ගය; දකුණට සහ බටහිරට:ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව සහ වෙනත් අය හිමිකම් කියන දොඹගහකුඹුර සහ කොන්ගහකුඹුර.

EOG 02 – 0510

1A – G 36090 – 20 (2022/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*